# විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## 2. උත්තර භාරතීය වයලින් වාදනය ඩිප්ලෝමා පාඨමාලාව - 2022/2023
## (Diploma in North Indian Violin - 2022/2023)

**පාඨමාලා කාලය** :- අවුරුදු 01 කි.

**සුදුසුකම්** :- ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය විෂයයන් 03 කින් සමත්වී තිබීම.

හෝ

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සාමර්ථය ලබා භාත්ඛණ්ඩෙ විශාරද (මධ්‍යම) සහතිකය ලබා තිබීම හෝ ජාතික සංගීත/නැටුම් (මධ්‍යම) සාමර්ථය ලබා තිබීම.

හෝ

විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් ඕනෑම සුදුසුකමක් සපුරා ඇති අයෙකු වීම

සහ

විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීම

**මාධ්‍යය** :- සිංහල

**පාඨමාලා ගාස්තුව** :- රු.90,000/- (වාරික 03 කින් ගෙවීම් කල හැක.)
(පළමු වාරිකය රු.60,000/- කි. දෙවන හා තෙවන වාරිකය රු.15,000/-බැගින්)

**දේශන පැවැත්වීම** :- ලිඛිත හා ප්‍රායෝගික දේශන **ඉරිදා දින පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා** විශ්වවිද්‍යාලයේ අනුමත ක්‍රමවේද යටතේ පැවැත්වේ.

❖ මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත ලේඛන වල මුල් පිටපත් scan කොට (PDF documents) සකස්කර ගත යුතුය.
1. ජාතික හැඳුනුම්පතෙහි දෙපස පැහැදිලි ඡායාරූප
2. උප්පැන්න සහතිකයෙහි දෙපස පැහැදිලි ඡායාරූප
3. අයදුම්පත් ගාස්තු ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ පැහැදිලි ඡායාරූපයක්
4. මෙම පාඨමාලාවේ සුදුසුකම් වලට අදාළ ලේඛන වල පමණක් පැහැදිලි ඡායාරූප

**ඉහත ලේඛන හා සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු වේ.**

❖ මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් ගාස්තු ලෙස අය කරනු ලබන රු. 1,000/- ක මුදල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ජංගම ගිණුම් අංක **71876640** දරණ ගිණුමට බැරවන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවක **කවුන්ටරය මගින් පමණක්** බැර කර ලබා ගන්නා කුවිතාන්සිය මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උඩුගත (Upload) කළ යුතුය.

නැතහොත්

විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය **www.vpa.ac.lk** හි Pay Online හරහා ගෙවීම් කරන්නේ නම් රු. 1030.00 ක මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස ගෙවීම් කර ලබා ගන්නා ලදුපත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උඩුගත (Upload) කළ යුතුය.

❖ **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය :-** අයදුම්කරුවන් මෙහි දැක්වෙන සබැඳිය ඔස්සේ පමණක් මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

❖ මෙම පාඨමාලාවට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම අයදුම් කළ හැකි අවසන් දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.**

❖ අයදුම්කළ හැකි අවසන් දිනය 2022.09.19 වේ.

විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
දුරකථන අංක: 0112854549
0112821338
E-mail codl@vpa.ac.lk